මහින්ද රාජපක්ෂ විද්‍යාලයය, හෝමාගම.

දෙවන වාර පරීක්ෂණය - 2013

සිංහල භාෂාව හා සාහිත්‍යය

6 ශ්‍රේණිය

| | |
|---|---|
| I පත්‍රය | |
| II පත්‍රය | |
| එකතුව | |

කාලය : පැය 2 යි

නම : ........................................................................ පන්තිය : ................

I කොටස

- ප්‍රශ්න සියල්ලට ම පිළිතුරු සපයන්න.
- අංක 01 සිට 07 දක්වා ප්‍රශ්නවලට නිවැරදි පිළිතුර තෝරා යටින් ඉරක් අඳින්න.

01. මහප්‍රාණ අක්ෂර එකකට වඩා යෙදුණු වචනය තෝරන්න.
i. මධ්‍යස්ථ ii. සංවර්ධන iii. සෞඛ්‍ය iv. භයානක

02. සිංහල අක්ෂර මාලාවේ ඇති ස්වර අක්ෂරයක් වන්නේ,
i. ට ii. ක iii. ඉ iv. ප

03. නිවැරදි අක්ෂර වින්‍යාසය සහිත පදය තෝරන්න.
i. ළදරුවා ii. සංවර්දනය iii. මර්ධනය iv. පුස්තකාලය

04. ප්‍රදර්ශනය යන පදයේ 'ප්‍ර' අකුරට යොදා ඇති පිල්ලම හඳුන්වන්නේ,
i. ඇලපිල්ල ii. ඇදය iii. රකාරාංශය iv. රේඵය

05. "අපි දිවි හිමියෙන් රට රැක ගනිමු." යි ගුරුතුමා සිසුන් අමතා කීවේ ය.
ඉහත වාක්‍යයේ ඇති විරාම ලක්ෂණ මොනවා ද?
i. ප්‍රශ්නාර්ථ ලකුණ සහ කොමාව
ii. විස්මයාදි ලකුණ සහ කොමාව
iii. යුගල උඩු කොමා සහ තිත
iv. ප්‍රශ්නාර්ථ ලකුණ

06. මුලින් දී ඇති පදයට සමානාර්ථ පදයක් ඇතුළත් නොවන වරණය තෝරන්න.
i. මුහුද - සාගරය , සිඳු
ii. වෙන්වීම - වියෝගය , වෙනස්වීම
iii. ප්‍රීතිය - ආනන්දය , ප්‍රමෝදය
iv. පියන - වැස්ම , ආවරණය

07. "අවස්ථාවෙන් ප්‍රයෝජන ගන්නවා" යන අර්ථය දෙන පිරුළ වන්නේ.
i. අතීසාරය ට අමුඩ ගැහුවා වගේ.
ii. අව්ව තියෙද්දි පිදුරු වේලා ගත්තා වගේ.
iii. අලි මදිවට කොටි කිව්වලු.
iv. අනේ කාලේ වනේ වාසේ.

● පහත සඳහන් වාක්‍ය සම්පූර්ණ කිරීමට සුදුසු නිවැරදි අක්ෂර වින්‍යාසය සහිත පදය වරහන් තුළින් තෝරා ලියන්න.

08. සිදු වූ අනතුරින් ඔහුගේ ..................... (දණ , දන) තුවාල විය.

09. ..................... (ළමා , ලමා) උයන් පිහිටුවීමට බොහෝ දෙනෙක් උනන්දු වූහ.

10. අධ්‍යක්ෂතුමා ........................ (කොට්ටාස , කොට්ඨාස) අධ්‍යාපන කාර්යාලය විවෘත කළේ ය.

11. ගොවියෝ කෘමින් ........................ (මර්ධනයට , මර්දනයට) කෙම් ක්‍රම භාවිතා කරති.

● පහත සඳහන් වාක්‍යවලට සුදුසු ක්‍රියා පද වරහන් තුළින් තෝරා ලියන්න.

12. තරු අහස පුරා නැග ..................... (එයි , එති).

13. මම දත් මැද මුව සෝදා නින්දට ........................ (ගියෙමු , ගියෙමි).

14. නුඹ අද පාඩම් ........................ (කළෙහිද? , කළෙහු ද?).

15. උත්තමයෝ මුසා බස් ........................ (නොකියති , නොකියහු).

16. තෙපි ගොයම් ........................ (කැපුවෙහි ද? , කැපුවෙහු ද?).

● අංක 17 සිට 20 දක්වා දී ඇති හිස්තැනට ගැළපෙන පදය වරහන් තුළින් තෝරා ලියන්න.

**(පහක්, අර්ථාවබෝධය, ආනයනය, තේමාව)**

17. සියලු වාහන .................................. සීමා කොට ඇත.

18. නිශ්ශබ්ද ව කියවීමෙන් .......................................... පහසු වේ.

19. සිංහල අක්ෂර මාලාවේ සඤ්ඤක අක්ෂර ............................ ඇත.

20. කවියක් නිර්මාණය කිරීමේ දී.............................. තෝරා ගැනීම ද වැදගත් වේ.

● පහත සඳහන් වාක්‍යවලට ඉරි ඇඳි පදයේ අර්ථයට වඩාත් සමීප අර්ථය දෙන පදය තෝරන්න.

21. ගුරුවරයා ශිෂ්‍යයින්ට අවවාද කළේ ඔවුන්ට අනර්ථයක් කිරීමේ අදහසින් නොවේ.
i. යහපත් ii. අධාරයක් iii. අවැඩක් iv. උපකාරයක්

22. බෙහෙත සිකුරට ම හරියන බව කාගේත් විශ්වාසය විය.
i. කිසි ලෙසකින් නොවරදින බව. iii. සිකුරාදාට සුව වන බව.
ii. සනීපය ලබා දෙන බව. iv. තමන්ගේ තරමට ගැළපෙන බව.

23. ඔහු පැහැර හැරියේ ඔහුට ලැබුණු ස්වර්ණමය අවස්ථාවකි.
i. වාසනාවන්ත ii. කාලෝචිත iii. රනින් කළ iv. ඉතා වටිනා

24. ඉවක් බවක් නැතිව කෙරෙන කැලෑ එළි කිරීම පරිසර විනාශයට මූලික හේතුවකි.
i. අනපේක්ෂිත iii. සොයා නොබලා
ii. නිතර ම iv. අවබෝධයක් නැති ව

● කමත් භාෂාවේ දී යෙදෙන පහත වචන සඳහා සාමාන්‍ය ව්‍යවහාරයේ යෙදෙන වචන වරහන් තුළින් තෝරා ලියන්න.

(පාගන්නට , පැසුණු ගොයම් කිරුව , කමතේ දී ගන්නා ආහාර , ලොකු පැදුරු , ගොයම් අහුර , අඩු වැඩිය , පිදුරු , ගොයම් කැපීමෙන් පසු කුඹුරේ ඉතිරිවන කොටස , ගොයම් ඉදිරිපිට , වී ගොඩ)

25. පාවර - ..........................................................

26. ගොයම් ඉස්සර - ..........................................................

27. වැදම - ..........................................................

28. මැඩුහත් - ..........................................................

29. ඉපනැල්ල - ..........................................................

30. උප්පිඩ - ..........................................................

(ල. 1 × 30 = 30)

## II කොටස

- ප්‍රශ්න සියල්ලට ම පිළිතුරු සපයන්න.

1. ඔබ පන්ති ක්‍රියාකාරකමක් ලෙස රඟ දැක් වූ නාට්‍ය ඇසුරෙන් පහත ප්‍රශ්නවලට පිළිතුරු සපයන්න.

   i. එම නාට්‍යයේ රචකයා කවුද? (ල. 02)

   ii. ඔහු රචිත වෙනත් නාට්‍ය දෙකක් නම් කරන්න. (ල. 02)

   iii. එම නාට්‍යයට අදාළ චරිත 03 ක් නම් කරන්න. (ල. 03)

   iv. එම චරිත අතරින් ඔබ වඩාත් සිත්ගත් චරිතය පිළිබඳ කෙටි විස්තරයක් ලියන්න. (පේළි 05 ක පමණ) (ල. 07)

   v. එම නාට්‍යයෙන් ඔබට ලබාගත හැකි ආදර්ශ 02 ක් ලියන්න. (ල. 02)

   (ල. 16)

2. පහත සඳහන් මාතෘකා අතරින් ඔබ කැමති මාතෘකාවක් තෝරාගෙන වචන 150 කට නොඅඩු වන සේ රචනාවක් ලියන්න.

   i. පොදු දේපල සුරකිමු.

   ii. සැඳෑ අසිරිය.

   iii. මා ගිය විනෝද චාරිකාවක්.

   iv. වැඩිහිටියන් ට ගරු කරමු.

   v. වනයක අසිරිය. (ල. 20)

3. ඔබ ප්‍රදේශයේ පැවැත්වෙන උත්සවයක් නැරඹීමට පැමිණෙන ලෙස දන්වමින් මිතුරෙකුට හෝ මිතුරියකට යවන ලිපියක් ලියන්න. (වචන 100 ක් පමණ සෑහේ) (ල. 10)

4. පහත සඳහන් ඡේදය පද බෙදා සුදුසු විරාම ලක්ෂණ යොදා නැවත ලියන්න.

   සිංහලරජකාලෙඉඳලමමේගහහරහාමේතොටුපළේඔරුපැද්දේඅපේමිනිස්සුමේකඅපේආත්තමුත්තනත්තපනත්තකිත්තකිරිකිත්තාකිරිකැමුත්තාකාලේඉඳලමඅපිකරගෙනආරස්සාව (ල. 10)

## <u>III කොටස</u>

5. පහත සඳහන් පාඨ කියවා අසා ඇති ප්‍රශ්නවලට කෙටි පිළිතුරු සපයන්න.

අ) **“මට කියවන්න පුළුවන් කණ්ණාඩියක් දෙන්න.”**

i. මෙම කොටස ඇතුළත් පාඩමේ නම කුමක් ද?
ii. මෙසේ ප්‍රකාශ කළේ කවුරුන් විසින් ද?
iii. මෙසේ ප්‍රකාශ කළේ කා හට ද? (ල. 1 × 3 = 3)

ආ) **“මා වීරිය ඇරපුවොත් සියල්ලෝම නසිති.”**

i. මෙම කොටස ඇතුළත් ඔබේ පෙළ පොතේ පාඩමට අදාළ ජන කතාව කුමක් ද?
ii. මෙසේ ප්‍රකාශ කළේ කවුරුන් විසින් ද?
iii. මෙහි සඳහන් **‘වීර්ය’** නැමැති පදයට සමාන පදයක් ලියන්න. (ල. 1 × 3 = 3)

ඇ) ඒ බොරුවට මා විහිළු කළා නොවැ
තරහද මගෙ නගෝ
රතට රතේ කජු පුහුලම් ඔබ දැක
සැහවෙනවා නගෝ

i. මෙම කොටස ඇතුළත් කවි පන්තියේ නම කුමක් ද?
ii. කවියේ ඇති පහත වචන වලට විරුද්ධ පද ලියන්න.

බොරුවට - ..............................

තරහ ද - .............................. (ල. 1 × 3 = 3)

6.

i. පහත දී ඇති කවිය සම්පූර්ණ කරන්න.

**හිසකේ හැපීම** ද

**ඉන්න තැන කෙළ ගැසුම** ද

..................................................

.................................................. (ල. 02)

ii. කවියේ අර්ථය ලියන්න. (ල. 03)